# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2016 මැයි මස 03 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.36 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**•පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා | ජගත් අංගගේ | මොහොමඩ් ෆයිරූස් |
| අනුරුද්ධ ලේකම්ගේ | ජගත් කුමාර | මොහොමඩ් ෆායිස් |
| අශෝක දයාරත්න | ජගත් පී. විතාන | යූ.එල්.එන්.පී. උඩවෙල |
| අමල් සිල්වා | ජයන්ත ද සිල්වා | රජිත හපුආරච්චිගේ |
| අර්ෂාඩ් නිසාම්ඩීන් | ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා | රන්දීර් රොද්‍රිගෝ |
| ඇන්ටනී උපුල් රාජිත | ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර | රවීන්ද්‍ර යසස් කුමානායක |
| ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් | තුවාන් ආමිත් මොහමඩ් අක්රම් | රවී විජේසේකර |
| ඊ.ජී. නන්දන පත්මකුමාර | තෙබුවන පියනන්ද හිමි | රොජර් සෙනෙවිරත්න |
| උදාර රත්නායක | නිමල් ආර්. පීරිස් | රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර් |
| උදේන විජේරත්න | නිමල් චන්ද්‍රරත්න | රොයිස් විජිත |
| උපාලි කොඩිකාර | නිරෝෂා අතුකෝරල මැතිනිය | රෝස් ප්‍රනාන්දු මෙනෙවිය |
| උපාලි ගුණරත්න | නිශාන්ත ශ්‍රී වර්ණසිංහ | ලක්ෂ්මන් නිපුණ ආරච්චි |
| උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ | නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු | ලයනල් ජයසිංහ |
| එම්.එස්.එම්. රහීම් | පී.ආර්.පී. අබේගුණවර්ධන | ලලිත් එල්ලාවල |
| එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය | පී.ඩී. අබේරත්න | ලලිත් වර්ණකුමාර |
| එස්. කුහවරදන් | ප්‍රදීප් උඳුගොඩ | ලෙනාඩ් කරුණාරත්න |
| එස්.එම්. සකාවුල්ලා | ප්‍රදීප් පෙරේරා | සරත් පතිරණ |
| ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව | බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන | සලෝචන ගමගේ |
| කිත්සිරි කහටපිටිය | මල්ෂා කුමාරණතුංග මැතිනිය | සහන් ප්‍රදීප් |
| කීර්ති කාරියවසම් | මහින්ද ජයසිංහ | සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා |
| කුරුසාමි කලන්කාඩි තේවර් | මහේෂ් අල්මේදා | සුනිල් වටගල |
| කේ.ඩී. අරුණ දීපාල් | මංජුල ප්‍රසන්න සම්පත් | ශිරන්ත අමරසේකර |
| කොලන්නගේ වජිර පෙරේරා | මංජුල බුද්ධදාස | ශ්‍රීනාත් පෙරේරා |
| කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය | මෙරිල් පෙරේරා | හරිස්චන්ද්‍ර කොස්තා |
| ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා | මොරිස් විජේරත්න | හෙක්ටර් බෙත්මගේ |

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනුරාධ විමලරත්න | ජනක දීපාල් වැලිවත්ත | සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය |
| අසෝක රන්වල | නව්සර් ෆව්සි | සරත් සුමනසේකර |
| ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා | නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන | සුසාර දිනාල් |
| ඉන්දික බණ්ඩාර | නිරෝෂන් පාදුක්ක | සුසිල් කිඳෙල්පිටිය |
| කාමල් කුරුප්පු | ලලන්ත ගුණසේකර | සෙනල් වෙල්ගම |
| චන්දන ජයකොඩි | විජිත් ප්‍රියන්ත | සේනක දමයන්ත ද සිල්වා |

## 01. ගරු සභාපතිතුමාගේ නිවේදන :

*"2016.05.03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන, වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කාර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකුව සිටින සෙනල් වෙල්ගම ගරු මන්ත්‍රීතුමා වෙනුවට ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාවද, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකුව සිටින ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා වෙනුවට සෙනල් වෙල්ගම ගරු මන්ත්‍රීතුමාවද පත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. විගණකාධිපති වාර්තාව : 2014

බස්නාහිර පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***එකී විගණකාධිපති වාර්තාව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන ලදී.***

## 03. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් කාරක සභා වර්තා පිළිගන්වන ලදී.

i. 2016.03.30 වන දින හා 2016.04.06 වන දින පැවැති ගෘහ කාරක සභා රැස්වීම් වාර්තා.

ii. 2016.04.20 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

***පූ.භා. 10.48 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 04. මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය : දෙවන වර කියැවීම

*"බස්නාහිර පළාතේ 2015 අංක ...... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය"* දෙවන වර කියැවීම සඳහා ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ එකඟතාවයන්ට යටත්ව සභා සම්මත විය.

## 05. මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය : තෙවන වර කියැවීම

*"බස්නාහිර පළාතේ 2016 අංක ...... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය"* තෙවන වර කියැවීම සඳහා ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් සංශෝධිතාකාරයෙන් ඉදිරිපත් කරන ලදී.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***

## 06. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද *"බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති"* පිළිබඳ යෝජනාව සභා සම්මත විය.

## 07. පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද *"2014 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම - 2015 වර්ෂය"* පිළිබඳ යෝජනාව සභා සම්මත විය.

## 08. රීති අංක 107 යටතේ යෝජනාව :

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනා සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

## 09. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : උතුරු පළාත් සභාව සම්මත කරන ලද ශ්‍රී ලංකාව ප්‍රාන්තවලට කැඩීමේ යෝජනාව ප්‍රතික්ෂේප කරන අතර ව්‍යවස්ථා හා නීති විරෝධී ක්‍රියා පිළිබඳව නීතිමය පියවර ගත යුතු බවට රජයට යෝජනා කිරීම

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලදී.

*"දෙමළ භාෂාව පදනම් කරගෙන උතුරු හා නැගෙනහිර පළාත් එකතු කර එක් ප්‍රාන්ත පාලනයකුත් රටේ සෙසු පළාත් හත (7) එකතු කොට සිංහල භාෂාව පදනම් කරගෙන තවත් ප්‍රාන්ත පාලනයකුත් ඇති කළ යුතු යැයි උතුරු පළාත් සභාව යෝජනාවක් ඉදිරිපත් කර සම්මත කරගෙන ඇත. මෙය ශ්‍රී ලංකාව තුළ භාෂාව පදනම් කරගෙන ෆෙඩරල් ආණ්ඩු දෙකක් ඇති කිරීමට කරන යෝජනාවකි. භූමිය, භාෂාව, ජන වර්ගය හා ආගම පදනම් කරගෙන ප්‍රාදේශීය බල බෙදීමකින් ජනතාවගේ ප්‍රශ්න විසඳිය නොහැකි අතර එමගින් ඇති වන්නේ වාර්ගික අනන්‍යතාවයක් මත විභේදයක් ඇතිවීම පමණි.*

*තිස්වසරක බෙදුම්වාදී ත්‍රස්තවාදයකට මුහුණදුන් රටක් ලෙස එය නිමා කිරීමෙන් පසු රටේ ජාතික සංහිඳියාව, සමගිය, සහජීවනය ගොඩනැගෙමින් පවතින අවස්ථාවක මෙවැනි යෝජනාවක් ගෙන ඒමෙන් සිදුවන්නේ සංහිඳියාවට බාධාවකි. ජන කොටස් අතර අවිශ්වාසය, සැකය වර්ධනයවීමක් පමණි. තවද මෙම යෝජනාව පළාත් අතර භේදකාරී තත්ත්වයක් ඇති කිරීමට හේතුවන අතර ජාතික ඒකාග්‍රතාවයට ද හානිකරය. රටේ ජාතික ආරක්ෂාවට, ස්වෛරීත්වයට තර්ජනයක් ඇති කරන බැවින් මෙම යෝජනාව සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත්, උතුරු පළාත් ආණ්ඩුකාරතුමාගේත් වහා අවධානය යොමු කළ යුතු බවත් ඒ සඳහා ව්‍යවස්ථාමය හා නෛතිකමය රාමුව තුළින් මැදිහත්වී මෙම යෝජනාව ප්‍රතික්ෂේප කළ යුතු බව බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටී."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***එවලේ, සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉහත යෝජනාව සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරන ලදී.***

*"සහ විපක්ෂ නායක ආර්. සම්බන්දන් මහතා හා අනුගාමිකයන් උතුරේ හමුදා කඳවුරුවලට බලෙන් ඇතුල්වීම ආදී රාජ්‍ය ආරක්ෂාවට තර්ජනය වන ක්‍රියා නැවැත්වීම හා උතුරේ ඓතිහාසික බෞද්ධ*

*සිද්ධස්ථානවල බෞද්ධ ප්‍රතිමා ඇතුළු ඉදි කිරීම් නැවැත්වීම ආදී බලහත්කාරී ක්‍රියා නැවත ඇති නොවීමට රජය වග බලා ගත යුතු අතර, තරාතිරම නොබලා සිදු කරන ලද ව්‍යවස්ථා විරෝධී හා නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් නීතිමය පියවර ගත යුතු යැයි මෙම සභාවට යෝජනා කර සිටී."*

***අනතුරුව, ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින්ද ඉහත යෝජනාව සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරන ලදී.***

*"මෙම යෝජනාව ප්‍රතික්ෂේප කරන අතර, එම යෝජනාව තුළින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, උතුරු පළාත් සභාව හා ප්‍රධාන අමාත්‍යවරයා හා එයට පක්ෂව ඡන්දය දුන් අය උල්ලංඝණය කර තිබෙන බැවින් ඔවුන්ට විරුද්ධව වහා නීතිය ක්‍රියාත්මක කර අත්අඩංගුවට ගත යුතු යැයි යෝජනා කරමි."*

***අ.භා. 12.30 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***අ.භා. 01.47 ට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***අ.භා. 03.13 ට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ලලිත් එල්ලාවල මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***

## 10. කල් තැබීම :

ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 04.34 ට, 2016 මැයි මස 17 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.05.04
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පූර්/04
Minuts 2016.05.03 - Hansard Section